# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/11 - 2020 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2020.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 3 වන සංශෝධනය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව

2016 මාර්තු 01 දිනැති, අංක 1956/16 හා 2019 සැප්තැම්බර් 16 දිනැති, අංක 2141/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2015 අගෝස්තු 21 දිනැති හා අංක 1928/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධනය 2015 අප්‍රේල් මස 17 වන දින සිට බලාත්මක විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 ජනවාරි මස 17 වැනි දින.

**10.3.2 *උසස් කිරීමේ ක්‍රමය* -**

සෑම වර්ෂයකම ජනවාරි මස 01 හා ජූලි මස 01 වන දිනට විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ඉහත 10.3.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ජ්‍යෙෂ්ඨතාවය අනුව විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(i) පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙළ අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාවට නොඅඩු නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙක්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරීක්ෂා කරනු ලැබේ.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරී සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

*සටහන* :

විශේෂ ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු ගණනය කරනු ලබන අවස්ථාවේ දී අමාත්‍ය මණ්ඩලය විසින් විශේෂ ශ්‍රේණියේ තනතුරකට, ඊට පහළ ශ්‍රේණියක නිලධාරියෙකු පත් කර ඇති අවස්ථාවක දී විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු ගණනය කිරීම සඳහා එම තනතුර ද පුරප්පාඩුවක් සේ සලකනු ලැබේ.

02 - 37

1A - G 31840 — 20 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*